# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

| 10/11 ශ්‍රේණි | සිංහල සාහිත්‍ය රසාස්වාදය | ඒකකය 1 - සතර කන් මන්ත්‍රණය |
|---|---|---|

1) i) අ) ජාතක කථාවක ආකෘතියේ දැකිය හැකි අංග තුන නම් කරන්න.
ආ) උම්මග්ග ජාතකයේ සතර කන් මන්ත්‍රණය සිදුවන්නේ කවුරුන් අතර ද?

ii) අ) ජාතක කථා මුල් කර ගත් ''ගී කාව්‍ය'' ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
ආ) ඔබ නම් කළ ''ගී කාව්‍ය'' සම්බන්ධ ජාතක කථාව ලියා දක්වන්න.

iii) අ) සතර කන් මන්ත්‍රණය සම්බන්ධ මූලාශ්‍ර සාහිත්‍ය ග්‍රන්ථය කුමක් ද?
ආ) එය ලියා ඇති භාෂා ව්‍යවහාරය කුමක් ද?

iv) අ) ජාතක පොත් වහන්සේ ලියා ඇති යුගය නම් කරන්න.
ආ) එකී යුගයේ මෙරට පාලකයා කවුරුන් ද?

v) අ) සතර කන් මන්ත්‍රණයේ සඳහන් චූල බ්‍රහ්මදත්ත හා වේදේහ රජතුමාගේ රාජධානි නම් කරන්න.
ආ) වේදේහ රජතුමාගේ පරිණත උපදේශකවරු දෙදෙනෙකු ලියා දක්වන්න.

vi) ''දැන්ම සකන් වැ ගියේ ය. නැවත අට කනකට ගොස් පසුව නොයෙක් සිය කනකට යන්නේ යැ''
අ) මෙසේ පවසන්නේ කවු ද?
ආ) කන් අටට අයත් වන්නෝ කවුරු ද?

vii) ''තොප අත තැබූ සාල් නැළියක් බුලත් මුළත් මසු දහසත් පිළිවෙළින් බිමතබා ලව''
අ) මෙසේ පවසන්නේ කවු ද?
ආ) මෙම ප්‍රකාශයට අදාළ මුල් ග්‍රන්ථය කුමක් ද?

viii) ''තොපට සුදුසු පඩුරක් සොයන්නෙමි අද මේ මිණි රුවන ලදිමි හැර ගනුව''
අ) මැණික අර ගැනීමට පවසන්නේ කවු ද?
ආ) එය ගන්නේ කුමක් සඳහා ද?

ix) ''නැඟී සිටුව ආචාරිනි මා නෙ වඳුව''
අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක් ද?
ආ) වැඳීමෙන් ප්‍රත්‍යක්ෂ වූ කරුණ කුමක් ද?

x) සතර කන් මන්ත්‍රණයේ සඳහන්
අ) චූලනී බ්‍රහ්මදත්ත රජුගේ මව කවුරුන් ද?
ආ) මහෞෂධ පඬිතුමාගේ ස්වාමි දියණිය කවුරුන් ද?

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

2) i) ''බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ එබස් අසා දණ්ඩෙන් ගසන ලද ආශීර්විෂයක්හු මෙන් ක්‍රෝධයෙන් දිලිහි කිපුණාහු''

අ) මෙසේ බ්‍රහ්මදත්ත රජු කෝපයට පත් වූයේ ඇයි?

ආ) මෙහි එන උපමාවෙහි උචිත බව වාක්‍යයකින් දක්වන්න.

ii) තුමූ අලුයම් වේලෙහි පිබිද සුවඳ තෙලෙහි නගන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නානා වර්ණ විචිත්‍ර චිත්‍රානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහු.

අ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව දක්වන්න.

අ) අංකිත පදයන්හි අරුත් දක්වන්න.

iii) පිටි රටින් දනව්වලින් සතර වාසල නියංගම් සතරින් වස්ත්‍රාභරණ ධනධාන්‍යාදීන් සමෘද්ධ වූ ඉසුරුමතුන් ගෙන්වා ඇතුළු නුවර වැස්ස වූ සේක.

අ) මෙලෙස වූ කාර්යයන් සිදු කරන්නේ මන් ද?

ආ) අංකිත පදයන්හි අරුත් දක්වන්න.

iv) පණ්ඩිතයන් වහන්සේට පමණක් කිය යුතු වී නම් උන් වහන්සේ ගේ දූසරුවට බස්නාහ. ඉදින් අමරා දේවිනුත් ඇසුව මනා වී නම් ඇකයෙහි ගොස් හිඳිනාහ.

අ) මෙලෙස ලැගුම් ගත්තේ කවරෙක් ද?

ආ) අංකිත පදයන්හි අරුත් දක්වන්න.

v) 'එව පින්වත්නි, මියුලු නුවර ගොස් වේදේහ රජ්ජුරුවන්ගේ ඉස තල්පැන් පලක් මඩනා සේ කඩුවෙන් කපා පියා දෙපයින් මැඩ ගෙන හිඳ ජය පානය බොම්හ''

අ) මේ හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

ආ) මෙම ප්‍රකාශයෙහි වූ උපමානය හා උපමේය වෙන වෙන ම දක්වන්න.

agaram.lk

3) විචාර ප්‍රශ්න (රසවින්දන)

1) උම්මග්ග ජාතකයේ සාර්ථකත්වයට එහි වූ .....

i) උපමාලංකාර

ii) සංවාදශීලි බස් වහර හේතු වී ඇත.

(එකකට උදාහරණ දෙක බැගින් ගෙන වචන 125 ක් පමණ සැහේ)

2) මානව සමාජයේ ප්‍රගතියට,

i) උපාය කෞශල්‍යය

ii) දූර්දර්ශි නුවණ

හේතු පාදක වන බව සතර කන් මන්ත්‍රණය මගින් පහදන්න.

(එකකට උදාහරණ දෙක බැගින් ගෙන වචන 125 ක් පමණ සැහේ)

3) අපූරු අවස්ථා හා සිද්ධි නිරූපණයට උම්මග්ග ජාතක කතුවරයා සමත්කම් දක්වා ඇති අයුරු සතර කන් මන්ත්‍රණය මගින් පහදන්න.)

(උදාහරණ තුනක් ගෙන වචන 100 ක් සැහේ)

සැකසුම:- දයානන්ද ගම්මන්පිල මයා

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!